සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/02/Ad/01/වැටුප් | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................ | දිනය<br>திகதி<br>Date 2025.03. 27 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
ගණකාධිකාරිවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීම**

ඉහත කරුණට අදාළව භාණ්ඩාගාරයේ ලේකම්ගේ අංක DMS/Salary Revision/2025-I හා 2025.03.25 දිනැතිව නිකුත් කරන ලද 01/2025 වැටුප් චක්‍රලේඛය හා බැඳේ. (අදාළ චක්‍රලේඛය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් භාගත කරගත යුතුය)

02. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන නිලධාරින්ගේ අදාළ වැටුප් පරිවර්ථනය ඉහත චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් නිවැරදිව අවබෝධ කරගෙන වැටුප් පරිවර්ථන කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

03. මෙම කාර්යය කඩිනමින් ඉටු කළ යුතු බැවින් ඒ සඳහා දැනුම ඇති සහාය කාර්යමණ්ඩලයක් යොදවාගෙන අප්‍රේල් මස වැටුපට වැටුප් සකස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කරන මෙන් දන්වා සිටිමි.

04. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 යටතේ වැටුප් ලැබූ නිලධාරින්ගේ 2024.12.31 දිනට ලැබූ මූලික වැටුප පදනම් කරගෙන මෙම වැටුප් පරිවර්ථනය සිදු කළ යුතුය. වැටුප් පරිවර්ථන සිදු කිරීම සඳහා ලබා දී ඇති චක්‍රලේඛ ආකෘතිය මත පමණක් සිදු කළ යුතු අතර, උපලේඛන 01 හා 02 වශයෙන් මෙන්ම ආදර්ශ පරිවර්ථන ඇතුළත් ඇමුණුම් අධ්‍යනය කර මෙම වැටුප් පරිවර්ථනය සිදු කළ යුතුය.

05. තවද අතිකාල, දින වැටුප් හා අනෙකුත් දීමනා ලබාදීමේ දී චක්‍රලේඛයේ ලබා දී ඇති උපදෙස්වලට අනුකූලවම කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ලේඛා ගීතාංජලී පෙරේරා,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන).

අත්. කලේ:- සී. ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ (පාලන) - දැ.ගැ.ස.
3. ප්‍රධාන ගණකාධිකාරි - දැ.ගැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |